**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**පුවත්පත් නිවේදනය**

**ඉන්දීය නාවික හමුදාවේ ජලශ්වා නෞකාව ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දීය ජාතිකයන් 700 දෙනෙකුට ආසන්න පිරිසක් මව්රටට රැගෙන යයි**

කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් විදෙස් රටවල සිරව සිටින ඉන්දියානු ජාතිකයන් නැවතත් මව්රටට ගෙන්වා ගැනීම යටතේ ඉන්දීය නාවික හමුදාවේ ජලශ්වා නෞකාව ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දියානු ජාතිකයන් 700 දෙනෙකුට ආසන්න පිරිසක් රැගෙන 2020 ජූනි මස පළමු වන දින කොළඹ වරායේ සිට ඉන්දියාවේ ටුටිකොරින් දක්වා පිටත් විය.

2. මෙය වන්දේ භාරත් මෙහෙයුම යටතේ විදේශයන්හි සිරව සිටින ඉන්දියානුවන් මව්රටට ගෙන්වා ගැනීම සඳහා ඉන්දීය නාවික හමුදා නෞකා යොදාගෙන කරනු ලබන සමුද්‍ර සේතු මෙහෙයුමේ කොටසකි.

3. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා කොළඹ වරායේදී ඉන්දීය ජාතික මගීන් හමුවූ අතර ඔවුන්ට ආරක්ෂිත ගමනක් ප්‍රාර්ථනා කළේය. එසේම එතුමා කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සිරව සිටින ඉන්දීය ජාතිකයන් නැවතත් මව්රටට යැවීම සඳහා ශ්‍රී ලංකා රජය ලබා දෙන සමීප සහයෝගයට සිය ස්තූතිය පළ කළේය.

4. මෙය INS ජලශ්වා නෞකාව ශ්‍රී ලංකාවට පැමිණෙන දෙවන අවස්ථාවයි. වසර තුනකට පමණ පෙර 2017 මැයි 30 වන දින INS ජලශ්වා නෞකාව ගංවතුර සහන මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට සහය වීම පිණිස මුදාගැනීමේ කණ්ඩායම් සහ සහනාධාර රැගෙන ශ්‍රී ලංකාවට පැමිණියේය. 2017 වසරේ ශ්‍රී ලංකාව මුහුණ දුන් දරුණු ගංවතුර සහ නායයාම් තත්වය පිළිබඳ වාර්තා වී පැය කිහිපයක් ඇතුළත ඉන්දියාව සහන මෙහෙයුම් සඳහා සහය වීමට ඉන්දීය නාවික හමුදාවේ කර්ච්, ශර්දූල් සහ ජලශ්වා යන නෞකා තුන ශ්‍රී ලංකාවට පිටත් කර එවන ලදී.

5. ඉන්දියානු සාගරයේ සහ ඉන් ඔබ්බට සමුද්‍රීය ආරක්ෂාව තහවුරු කිරීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට අමතරව ඉන්දියාව අර්බුද කාලයන්හි සහකාර රට වලට පළමුවෙන්ම ප්‍රතිචාර දක්වන රාජ්‍යයද වේ. 2004 වසරේ සුනාමි ව්‍යසනයේ සිට ඉන්දීය නාවික හමුදා නෞකා ඉන්දියානු සාගරය පුරා විවිධ මානුෂීය සහ ආපදා සහන මෙහෙයුම් ක්‍රියාත්මක කර ඇත. මෑත වසර වලදී, ඉන්දීය නාවික හමුදා නෞකා විවිධ රට වලට

සහනාධාර මෙන්ම සහයෝගය ලබා දී ඇත. 2019 වසරේ මොසැම්බික් රාජ්‍යයට බලපෑ ඉඩායි සුළි කුණාටුව,2018 වසරේ සිදුවූ ප්‍රබල භූමි කම්පාවකින් පසු ඉන්දුනීසියාවට බලපෑ සුනාමි තත්වය සහ 2018 වසරේදී මොරිෂස් රාජ්‍යයට බලපෑ බර්ගීටා සුළි කුණාටුව ඉන්දියානු නාවික හමුදා යාත්‍රා සහය වූ මෙවැනි අවස්ථා කිහිපයකි. එසේම 2017 වසරේදී බංග්ලාදේශයට බලපෑ මෝරා සුළි කුණාටුවෙන් අනතුරුව ඉන්දීය නාවික හමුදාව විසින් බංග්ලාදේශ ධීවරයන් බේරා ගත් අතර මාලදිවයිනේ මාලේ නුවර මුහුදු ජල පවිත්‍රාගාරයක් ගින්නට හසුවීමෙන් පසුව එරටට පානීය ජලයද ලබා දෙන ලදී.

6. මානුෂීය සහය ලබා දීමට අමතරව මුහුදු මංකොල්ලයන්ට සහ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ක්‍රියාකාරි දායකත්වයක් මෙන්ම ත්‍රස්තවාදයට එරෙහිව සහයෝගය ලබා දෙන ඉන්දියාව සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ සාමය, සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පුරෝගාමීව කටයුතු කරයි.

කොළඹ

ශක වර්ෂ 1942 ජ්‍යෙෂ්ත 11

2020 ජූනි 01